**පෞද්ගලික සෞඛ්‍ය සේවා නියාමන සභාව - 2018**

**-----------------------------------------------------------**

**තත්ත්වාගණනය කළ මතය**

පෞද්ගලික සෞඛ්‍ය සේවා නියාමන සභාවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, නියාමන සභාවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.1 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, නියාමන සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය නියාමන සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා නියාමන සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

නියාමන සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, නියාමන සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.3 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස නියාමන සභාවේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් නියාමන සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ නියාමන සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ නියාමන සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නියාමන සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.4 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරිබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබා ගැනීමට ප්‍රමාණවත් “මනාලෙස සැලසුම් කරන ලද” අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 1 | | |
| (i) ප්‍රමිතයේ 132 ඡේදය ප්‍රකාරව,සැළකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශයක් හෙළිදරව්කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කරන බව. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී භාවිතා කළ මිනුම්කරණ පදනම් වේ නම් එම පදනම් සහ මූල්‍ය ප්‍රකාශන තේරුම්ගැනීමට අදාළ වන භාවිත අනෙකුත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) | ප්‍රමිතයේ 108 ඡේදය ප්‍රකාරව, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ මුහුණතෙහි හෝ සටහන් තුළ මුළු අයභාරයේ උපවර්ගීකරණයක් අදාළ අස්ථිත්වයේ මෙහෙයුම්වලට යෝග්‍ය පරිදි වර්ගීකරණයකර ඉදිරිපත් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ ලියාපදිංචි ගාස්තු ලෙස ලැබී තිබුණු රු.26,095,000 ක ආදායම වර්ගීකරණයකර ඉදිරිපත් කර නොතිබුණි. | සමාලෝචිත වර්ෂයේ ලියාපදිංචි ගාස්තු පිළිබඳ විස්තරාත්මක වාර්තාවක් ඉදිරිපත් කරන බව, වෛද්‍ය ආයතන ලියාපදිංචිය සඳහා සහ ගිණුම්කරණ කටයුතු සඳහා පරිගණක ක්‍රමවේදයක් සකස් කරමින් සිටින බව හා ඉදිරි මාස කිහිපය තුළ එකී කටයුතු අවසන් කිරීමට බලාපොරොත්තු වන බව. | මූල්‍ය කාර්යයසාධන ප්‍රකාශනයෙහි මුහුණත හෝ සටහන් තුළ ලියාපදිංචි ගාස්තු ආදායමේ උපවර්ගීකරණයක් ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 65 ඡේදය ප්‍රකාරව, ජංගම නොවන වත්කම් සඳහා ප්‍රයෝජනවත් ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය කර නොතිබුණු අතර ගෘහ භාණ්ඩ හා සවිකිරීම්, කාර්යාල උපකරණ හා පරිගණක උපකරණවලින් සමන්විත සියළුම ජංගම නොවන වත්කම් වාර්ෂිකව සියයට 5 බැගින් ක්ෂය කර තිබුණි. | මේ සම්බන්ධව සොයා බලා ඉදිරියේදී කටයුතු කිරීමට බලාපොරොත්තු වන බව. | ජංගම නොවන වත්කම් සඳහා ප්‍රයෝජනවත් ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ---------------------- | ---------------------- | ----------------- |
| (අ) | පෞද්ගලික වෛද්‍ය ආයතන ලියාපදිංචි කිරීමේ ගාස්තු ආදායම මුදල් පදනමට ගිණුම්ගත කර තිබුණි. | වෛද්‍ය ආයතන ලියාපදිංචි කටයුතු සඳහා පරිගණක ක්‍රමවේදයක් සකස් කරමින් සිටින බව හා ඉදිරි මාස කිහිපය තුළ මෙම ගැටළු අවසන් කිරීමට බලාපොරොත්තු වන බව. | උපචිත පදනමට ආදායම හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ස්ථාවර තැන්පත් පොලී ආදායම රු.949,785 ක්, ගෙවිය යුතු සේවක අර්ථසාධක අරමුදල් රු.44,253 ක් හා ගෙවිය යුතු සේවක භාරකාර අරමුදල් රු.11,063 ක් ගිණුම්ගත කර නොතිබුණි. | ස්ථාවර ගිණුමට අදාළ අදායම බැංකු ගත කොට ඇති බව. | උපචිත පදනමට අනුව ලැබිය යුතු ආදායම් සහ ගෙවිය යුතු වියදම් හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2018 දෙසැම්බර් 31 දිනට පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශනය තුලනය කිරීම සඳහා රු.309,000 ක් හා රු.53,115 ක් පිළිවෙලින් මුදල් ශේෂයට එකතුකර හා අඩුකර තිබුණි. | මේ සම්බන්ධයෙන් සොයා බලා වාර්තා කිරීමට බලාපොරොත්තු වන බව. | මාසික බැංකු සැසඳුම් ප්‍රකාශන නිවැරදිව පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය. |

### 1.5.4 අවිනිශ්චිත ගිණුම්

| විෂයය | මුදල | අවිනිශ්චිත ලෙස තිබුණු කාලය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | රු. | | | |
| Fund Transfer Account | 232,400 | වසර 03 | මෙය 2015 වර්ෂයේදී සිදු වූ ගිණුම්කරණ දෝෂයක් වන බව. | Fund Transfer Account නමින් පවතින මෙම ගිණුමේ ශේෂය හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.6 නීති රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

| නීති, රීති හා රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වන වගන්තිය | අමාත්‍යාංශය භාර අමාත්‍යවරයාගේ හා මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව නියාමන සභාව විසින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට රු.31,319,012 ක් ස්ථාවර තැන්පතුවලද රු.10,000,000 ක් භාණ්ඩාගාර බිල්පත්වලද ආයෝජනය කර තිබුණි. | භාණ්ඩාගාර බිල්පත් සහ ස්ථාවර තැන්පතුවල ආයෝජනය කිරීමට සභාවෙහි මාසික රැස්වීමේදී අනුමැතිය ලබාගෙන ඇති බව. | 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වන වගන්තිය ප්‍රකාරව, අමාත්‍යාංශය භාර අමාත්‍යවරයාගේ හා මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගැනීමෙන් පසුව පමණක් ආයෝජනයන් සිදුකළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීමේ පනත | නියාමන සභාවේ නිලධාරීන් හා සේවකයින් 09 දෙනා වෙනුවෙන් පාරිතෝෂික වියදම සඳහා වෙන්කිරීමක් සිදුකර නොතිබුණි. | දැනට මීට අදාළ ක්‍රමවේදයක් සකසා නොමැති බව හා ඉදිරියේදී ඒ සඳහා කටයුතු කිරීමට බලාපොරොත්තු වන බව. | පනත ප්‍රකාරව නියාමන සභාවේ නිලධාරීන් හා සේවකයින් වෙනුවෙන් පාරිතෝෂික වියදම සඳහා වෙන්කිරීමක් සිදුකළ යුතුය. |
| (ඇ) | 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත හා 1465/19 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය | යම් මුදලක් රු.25,000 කට වැඩි වන අවස්ථාවකදී දෙන ලද ලදුපතක් වෙනුවෙන් රු.25 ක මුද්දර බදු අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි. | දැනට මීට අදාළ ක්‍රමවේදයක් සකසා නොමැති බව හා ඉදිරියේදී ඒ සඳහා කටයුතු කිරීමට බලාපොරොත්තු වන බව. | 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත හා 1465/19 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය අනුව කටයුතු කළ යුතුය. |
| (ඈ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>--------------------- | | | |
| | (i) මුදල් රෙගුලාසි 137, 139 හා 262(2) | වවුචර් 306 ක් මගින් රු.20,589,946 ක් ගෙවීමේදී, ගෙවීම් සහතික කිරීම පමණක් සිදු කර තිබුණු අතර ගෙවීම් අනුමත කිරීමට හෝ ගෙවීම් කළ බවට අත්සන් කිරීමට හෝ කටයුතු කර නොතිබුණි. තවද "ගෙවන ලදී" මුද්‍රාව තබා නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි ලෙස කටයුතු කිරීමට බලාපොරොත්තු වන බව. | මුදල් රෙගුලාසි සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | (ii) මුදල් රෙගුලාසි 225(4) | වවුචර් 6 ක් මගින් රු.172,900 ක් ගෙවීමේදී, වවුචර් පිළියෙල කරන හෝ ඒවායේ හරි වැරදි බලන නිලධාරීන් සිය කෙටි අත්සන තබා නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි ලෙස කටයුතු කිරීමට බලාපොරොත්තු වන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| | (iii) මුදල් රෙගුලාසි 431(3) | ආයෝජනවල ප්‍රකාශන අගය, ගැනුම් මිල, විකිණීමෙන් ලත් මුදල, ප්‍රතිඵල ලාභය හෝ අලාභය, ලාභාංශ, ලාභාංශ ලැබුණු දිනය ආදී වූ විස්තර ඇතුළත් ආයෝජන ලේඛනයක් පවත්වා නොතිබුණි. | ඉදිරියේදී ආයෝජන ලේඛනයක් පවත්වා ගැනීමට බලාපොරොත්තු වන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ආයෝජන ලේඛනයක් පවත්වාගත යුතුය. |
| (ඉ) | 1978 දෙසැම්බර් 10 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | 2018 දෙසැම්බර් 31 දිනට පැවති පිරිවැය රු.1,848,956 ක් වූ ස්ථාවර වත්කම් වෙනුවෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. | ඉදිරියේදී ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගැනීමට කටයුතු කරන බව. | ස්ථාවර වත්කම් ලේඛනයක් පිළියෙල කර එය යාවත්කාලීනව පවත්වා ගත යුතුය. |
| (ඊ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | 2018 දෙසැම්බර් 31 දිනට පැවති පිරිවැය රු.3,102,640 ක් වූ පරිගණක හා මෘදුකාංග සඳහා ස්ථාවර වත්කම් ලේඛනයක් යාවත්කාලීනව පවත්වා නොතිබුණි. | මේ වන විටත් පරිගණක හා මෘදුකාංග ලේඛනයක් පවත්වාගෙන යනු ලබන බව. | දැනට පවත්නා ලේඛනය යාවත්කාලීන කර නොතිබුණු බැවින් එය යාවත්කාලීනව පවත්වාගෙන යා යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.6,167,170 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.2,466,375 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.3,700,795 ක පිරිහීමක් නිරීක්ෂණය විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව ආදායම් රු.5,252,992 කින් වැඩිවී තිබුණද පරිපාලන වියදම් රු.5,896,888 කින් වැඩිවී තිබීම හා වැටුප් ව්‍යුහය වෙනස්වීම මත සේවක වැටුප් රු.2,186,772 කින් වැඩිවී තිබීම ඉහත පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ ලියාපදිංචි ගාස්තු ආදායම රු.26,095,000 ක් වූ අතර ඉකුත් වර්ෂයේ එම ආදායම රු.21,944,000 ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ලියාපදිංචි ගාස්තු ආදායම රු.4,151,000 කින් වැඩිවී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකවරුන් නිලබලයෙන් සභාවේ සාමාජිකයින් වන බැවින් ඔවුන්ගෙන් තොරතුරු ලබාගෙන එක් එක් පළාත සඳහා අවශ්‍ය කාර්යය මණ්ඩලය තක්සේරු කර ගැනීමේ හැකියාව තිබියදී හා කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ උපදෙස් ලබා ගෙන වැටුප් ව්‍යුහයන් පිළියෙල කිරීමට අවස්ථාව තිබියදී, ඒ වෙනුවට නියාමන සභාවට අවශ්‍ය කාර්යය මණ්ඩලය තක්සේරු කිරීමේ හා වැටුප් ව්‍යුහයන් පිළියෙල කිරීමේ කාර්යය උපදේශක සමාගමක් වෙත භාරදී තිබුණු අතර ඒ වෙනුවෙන් රු.320,300 ක් ගාස්තු ලෙස ගෙවා තිබුණි. | සභාවේ තීරණයකට අනුව, ආයතනයේ කාර්යභාරය හඳුනාගෙන එයට ගැලපෙන ආකාරයට බඳවා ගැනීම සඳහා නව පරිපාටිය සකස් කිරීම සිදු කොට ඇති බව. | අනාර්ථික වියදම් අත්හැරිය යුතුය. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ----------------------- | ---------------- | ----------- |
| (අ) | නියාමන සභාව විසින් එකතු කරනු ලබන වාර්ෂික ලියාපදිංචි ගාස්තු ආදායමෙන් සියයට 50 ක් පළාත් සභාවලට ලබාදීමට ප්‍රථම, පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් පෞද්ගලික සෞඛ්‍ය අංශ සංවර්ධනයට අදාළව වාර්ෂික අයවැය ඇස්තමේන්තුව සමඟ වාර්ෂික යෝජනාවක් ඉදිරිපත් කළ යුතු බවට හා වර්ෂය අවසානයට වියදම් හා ක්‍රියාකාරකම් පිළිබඳව වාර්තාවක් ඉදිරිපත් කළ යුතු බවට වූ විධිවිධාන ඇතුළත් කරමින් 2006 අංක 21 දරන පෞද්ගලික වෛද්‍ය ආයතන (ලියාපදිංචි කිරීමේ) පනතේ 3(5) වගන්තිය සංශෝධනය කිරීමට 2015 ජූලි 09 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණි. අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී වර්ෂ 03 ක් ගතවී තිබුණද පනත සංශෝධනය කර නොතිබුණු අතර වාර්ෂික ලියාපදිංචි ගාස්තු ආදායමෙන් සියයට 50 ක් පළාත් සභාවලට ලබාදී තිබුණි. | මේ පිළිබඳව සොයාබලා ඉදිරියේදී අදාළ කටයුතු සිදුකිරීමට බලාපොරොත්තු වන බව. | 2015 ජූලි 09 දින ලැබී තිබුණු අමාත්‍ය මණ්ඩල අනුමැතිය පරිදි 2006 අංක 21 දරන පෞද්ගලික වෛද්‍ය ආයතන (ලියාපදිංචි කිරීමේ) පනතේ 3(5) වගන්තිය කඩිනමින් සංශෝධනය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ලියාපදිංචි විය යුතු නිශ්චිත කාල වකවානුවක් පනතේ හෝ නියමු උපදේශන මගින් සඳහන් කර නොතිබීම හේතුවෙන් වෛද්‍ය ආයතන ලියාපදිංචිය වෙනුවෙන් කවර දිනක හෝ මුදල් ලද පසු අදාළ වර්ෂය සඳහා ලියාපදිංචි සහතික නිකුත් කිරීම සිදු කර තිබුණු අතර දඩ මුදලක් අයකර නොතිබීම හේතුවෙන් වර්ෂය මුලදී සභාවට ලැබිය යුතු ආදායම ප්‍රමාදවී ලැබී තිබුණි. | පෞද්ගලික වෛද්‍ය ආයතන ලියාපදිංචි කිරීමේ හා වාර්ෂිකව යාවත්කාලීන කිරීමේ ක්‍රියාවලියේ පවතින අඩුපාඩු හේතුවෙන් ලියාපදිංචිය ප්‍රමාදවී ඇති නිසා ඉදිරියේදී online ක්‍රමය මගින් ලියාපදිංචිය සිදු කිරීමට මේ වන විටත් කටයුතු සම්පාදනය කර ඇති බව, ප්‍රමාදවී ලියාපදිංචියට අයැදුම් | පෞද්ගලික වෛද්‍ය ආයතන ලියාපදිංචි විය යුතු නිශ්චිත කාලවකවානුවක් තීරණය කර එම කාලවකවානුව තුළ ලියාපදිංචි නොවන ආයතනවලින් දඩ මුදලක් අය කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | කරන වෛද්‍ය ආයතන සඳහා දඩ මුදලක් සභාව වෙත යෝජනා කිරීමට බලාපොරොත්තු වන බව. | |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේදී පෞද්ගලික ආයතනයක් වෙත රු.2,070,000 ක් ගෙවා, පෞද්ගලික අංශයේ රෝහල් හා ආයතනවල විශේෂඥ සේවා, වෛද්‍ය හා ශල්‍යකර්ම සඳහා නිශ්චිත පිරිවැය ක්‍රමයක් පිළයෙල කරවාගෙන ක්‍රියාත්මක කර තිබුණි. නමුත් ගාස්තු තීරණය කිරීමේදී පෞද්ගලික රෝහල්වල එකිනෙකට වෙනස් වූ ගුණාත්මක සාධක පිළිබඳව සැලකිල්ලට නොගෙන පොදු පදනමකින් උපරිම ගාස්තු පිළියෙල කර තිබුණු බවට චෝදනා කරමින් පෞද්ගලික රෝහල් 03 ක් විසින් 2018 ඔක්තෝබර් මාසයේදී සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යවරයා ඇතුළුව ඇතුළුව තවත් පාර්ශවයන් 08 කට එරෙහිව නඩු පවරා තිබුණි. | සභාව විසින් ගන්නා ලද තීරණයකට අනුව, ජාත්‍යන්තර පිළිගැනීමක් ඇති ගිණුම්කරණ උපදේශන ආයතන 5 කින් ලද අයදුම් පත් ඇගයීමෙන් අනතුරුව සුදුසු ආයතනය තෝරා ව්‍යාපෘතිය ආරම්භ කරන ලද බව, ව්‍යාපෘතිය අවසානයේ ලැබුණු දත්ත උපයෝගී කොට ගෙන අමාත්‍යවරයාගේ අධීක්ෂණය මත පිළියෙළ කරන ලද රෝහල් ගාස්තු ගැසට් කළ බව හා ඊට එරෙහිව පෞද්ගලික රෝහල් 09 ක් විසින් නඩු පවරා ඇති බවත්. | නඩුවෙහි තීරණයද සලකා බලා පෞද්ගලික අංශයේ රෝහල් හා ආයතනවල විශේෂඥ සේවා,වෛද්‍ය හා ශල්‍යකර්ම සඳහා නිශ්චිත පිරිවැය ක්‍රමයක් සාධාරණ පදනමකින් පිළියෙල කර ගැසට් කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2006 අංක 21 දරන පෞද්ගලික වෛද්‍ය ආයතන ලියාපදිංචි කිරීමේ පනතේ 2(1) උප වගන්තියේ විධිවිධාන ප්‍රකාරව, සියළුම පෞද්ගලික වෛද්‍ය ආයතන ලියාපදිංචි විය යුතු වුවද, 2018 දෙසැම්බර් 31 දින වන විට ලියාපදිංචිවී තිබුණු පෞද්ගලික වෛද්‍ය ආයතන සංඛ්‍යාව 1,387 ක් පමණක් විය. නමුත් ලියාපදිංචි වියයුතු පෞද්ගලික වෛද්‍ය ආයතන සංඛ්‍යාව හඳුනාගැනීමට, ලියාපදිංචි කරවීමට හා ලියාපදිංචි නොවන ආයතන සම්බන්ධයෙන් පනතේ 4 වන වගන්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමට විධිමත් ක්‍රමවේදයක් පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි. | මුළු දිවයිනම ආවරණය වන සේ පෞද්ගලික වෛද්‍ය ආයතන පිළිබඳ සංගණනයක් පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකවරුන්, දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධක්ෂකවරුන් සහ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්ගේ උපදේශකත්වයෙන් සහ සහභාගීත්වයෙන් මේ වන විටත් සිදුකරගෙන යනු ලබන බව. | සභාවේ ලියාපදිංචි වියයුතු වෛද්‍ය ආයතන හඳුනාගැනීමටත්, ලියාපදිංචි නොවන ආයතන සම්බන්ධයෙන් පනතේ 4 වන වගන්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමටත් විධිමත් ක්‍රමවේදයක් පිළියෙල කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2006 අංක 21 දරන පෞද්ගලික වෛද්‍ය ආයතන ලියාපදිංචි කිරීමේ පනතේ 9 වගන්තිය ප්‍රකාරව, ලියාපදිංචි පෞද්ගලික වෛද්‍ය ආයතන විසින් පවත්වා ගෙන යායුතු ප්‍රමිති සංවර්ධනය කිරීම හා අධීක්ෂණය කිරීමට, දැනට පවත්වාගෙන යනු ලබන ප්‍රමිති ඇගයීමේ ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමට, සේවක පිරිස් බඳවා ගැනීම්වලදී අවම සුදුසුකම් අනුගමනය කරන බවට සහතිකවීම හා සේවක පිරිස් පුහුණු කිරීමේදී අවම ප්‍රමිතීන් අනුගමනය කරන බවට වග බලා ගැනීමට සහ සපයනු ලබන රෝගීන් රැකබලා ගැනීමේ සේවාවල ගුණාත්මකභාවය | පෞද්ගලික වෛද්‍ය ආයතන වෙත පැවතිය යුතු අවම සුදුසුකම් සහ ප්‍රමිතීන් ඇතුළත්ව ලියාපදිංචිය සඳහා අවශ්‍ය මාර්ගෝපදේශ පිළියෙල කර රෙගුලාසි බවට පත්කිරීම සඳහා නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවට යවා ඇති බව, ඒ ඒ පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ හෝ සුදුසුකම් ලත් නිලධාරී මණ්ඩලයක් විසින් පෞද්ගලික වෛද්‍ය ආයතනවල ප්‍රමිතිය පිළිබඳ නිසි ඇගයීමකින් අනතුරුව | නියාමන සභාව ආරම්භ කර වර්ෂ 13 ක් ගතවන නමුත් 2006 අංක 21 දරන පෞද්ගලික වෛද්‍ය ආයතන ලියාපදිංචි කිරීමේ පනතේ 9 වගන්තිය ප්‍රකාරව කටයුතු නිමකර ගැනීමට අපොහොසත්වී ඇති බැවින්, ඒ පිළිබඳව විශේෂ අවධානය යොමු කර අදාළ මාර්ගෝපදේශ රෙගුලාසි බවට පත්කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | තහවුරු කිරීමට විධිමත් ක්‍රමවේදයක් පිළියෙල කර ක්‍රියාත්මක කිරීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අපොහොසත් වී තිබුණි. | ලියාපදිංචිය සඳහා අනුමැතිය ලබා දෙන බව, පෞද්ගලික වෛද්‍ය ආයතන වල නිරත සේවක පිරිස් වල සුදුසුකම් අධීක්ෂණය වන බව හා සභාව විසින් ඔවුන් සඳහා පුහුණු පාඨමාලා ක්‍රියාත්මක කරන බව. | |
| (ඇ) | 2006 අංක 21 දරන පෞද්ගලික වෛද්‍ය ආයතන ලියාපදිංචි කිරීමේ පනතේ 13(1) වගන්තිය ප්‍රකාරව, සභාවේ උපදෙස් මත ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින්, පෞද්ගලික වෛද්‍ය ආයතන සඳහා ප්‍රතීතනය කිරීමේ යෝජනා ක්‍රමයක් ක්‍රමවත්ව දක්වා ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි. | විෂයභාර අමාත්‍යවරයා සමඟ ඉදිරියේදී සාකච්ඡා කොට මේ පිළිබඳව පියවර ගැනීමට කටයුතු කරන බව. | පෞද්ගලික වෛද්‍ය ආයතන ප්‍රතීතනය සඳහා යෝජනා ක්‍රමයක් ක්‍රමවත්ව දක්වා ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2006 අංක 21 දරන පෞද්ගලික වෛද්‍ය ආයතන ලියාපදිංචි කිරීමේ පනතේ 18(2) උප වගන්තියේ (උ) ඡේදය ප්‍රකාරව, සම්බන්ධතාවක් දක්වන හෝ අතෘප්තියට පත් තැනැත්තකු විසින් යම් පෞද්ගලික වෛද්‍ය ආයතනයකට හෝ එයට සම්බන්ධ තැනැත්තෙකුට විරුද්ධව කරනු ලබන යම් පැමිණිල්ලක් භාර ගැනීමේදී හා එම පැමිණිල්ල අවසාන වශයෙන් බැහැර කිරීමේදී අනුගමනය කළ යුතු කාර්ය පරිපාටි හෝ පරිචයන් පිළිබඳ නියෝග පිළියෙල කිරීමට කටයුතු කර නොතිබුණි. | පෞද්ගලික වෛද්‍ය ආයතනවලට එරෙහිව ලැබෙන පැමිණිලිවලට අදාළව නිසි මාර්ගෝපදේශයක් සකසා අමාත්‍යාංශයේ නීති අංශය වෙත යොමුකර ඇති බව හා පැමිණිලි විභාග කිරීමට පැමිණිලි කමිටුවක්ද පත්කර ඇති බව. | යම් පෞද්ගලික වෛද්‍ය ආයතනයකට හෝ එයට සම්බන්ධ තැනැත්තෙකුට විරුද්ධව කරනු ලබන යම් පැමිණිල්ලක් භාර ගැනීමේදී හා එම පැමිණිල්ල අවසාන වශයෙන් බැහැරකිරීමේදී අනුගමනය කළ යුතු කාර්ය පරිපාටි හෝ පරිචයන් පිළිබඳ නියෝග පිළියෙල කර එම නියෝග නීතිගත කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.4 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| නියාමන සභාව සතු කාර්යයභාරය හා එහි ප්‍රමාණය හඳුනාගෙන එයට ගැලපෙන ආකාරයට කාර්යය මණ්ඩලය අනුමත කර ගැනීමකින් තොරව නිලධාරීන් 09 දෙනෙකු බඳවාගෙන තිබුණි. | ආයතනයේ කාර්යභාරය හඳුනාගෙන එයට ගැලපෙන ආකාරයට බඳවා ගැනීම සඳහා පිළියෙල කරන ලද නව පරිපාටිය සඳහා සභාවේ අනුමැතිය හිමිව ඇති බව, සභාව විසින් ගන්නා ලද ප්‍රතිපත්තිමය තීරණයක් මත කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු ලියාපදිංචිය සිදු නොකරන ලද බව. | නියාමන සභාව සතු කාර්යයභාරය හා එහි ප්‍රමාණය හඳුනාගෙන එයට ගැලපෙන ආකාරයට කාර්යය මණ්ඩලය පිළියෙල කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගත යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 තිරසාර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2017 අගෝස්තු 14 දිනැති අංක එන්පී/එස්පී/එස්ඩීජී/17 දරන ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරන ලද චක්‍රලේඛය හා තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර “2030 න්‍යාය පත්‍රය” පිළිබඳව නියාමන සභාව විසින් දැනුවත් වී නොතිබීම හේතුවෙන් තම විෂය පථය යටතට වැටෙන කාර්යයන් සම්බන්ධයෙන් තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟාවිය යුතු සන්ධිස්ථානයන්ද ඉලක්ක මත ළඟාවීම මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් නිසි පරිදි දැනුවත් නොමැති අතර ඉදිරියේදී සොයාබලා කටයුතු කිරීමට බලාපොරොත්තු වන බව. | නියාමන සභාව විසින් තම විෂය පථය යටතට වැටෙන කාර්යයන් සම්බන්ධයෙන් තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟාවිය යුතු සන්ධිස්ථානයන්ද ඉලක්ක මත ළඟාවීම මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනාගැනීමට කටයුතු කළ යුතුය. |